# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

**11 ශ්‍රේණිය**

## කතෝලික ධර්මය - I

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 1 යි

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01)දේව අනාවරණයේ ප්‍රධාන මූලාශ්‍ර දෙක වන්නේ
1) ශුද්ධ බයිබලය හා ගැලවීමේ ඉතිහාසය
2) ශුද්ධ බයිබලය හා ජීවන සභා සම්ප්‍රදය
3) සභා සම්ප්‍රදය හා ස්වභාවධර්මය
4) විශ්වය හා ජනවන්දනාව

02)ශු. බයිබලය ලේඛනගත වූ කාලය ලෙස සලකන්නේ
1) ක්‍රි.පූ. 950 - ක්‍රි.ව. 100 ත් අතර
2) ක්‍රි.ව. 100 - ක්‍රි.ව. 950 ත් අතර
3) ක්‍රි.ව. 01 - ක්‍රි.ව. 33 ත් අතර
4) ක්‍රි.ව. 50 - ක්‍රි.ව. 100 ත් අතර

03)ශු. ලූක් තුමා විසින් රචනා කරන ලද කෘතීන් පිළිගන්වන ලද්දේ "තියෝපිලස්" නම් උසස් නිළධාරියාටය. "තියෝපිලස්" යන නමෙහි අර්ථය
1) උසස් නිළධාරියා
2) ආසිරිලත් මිත්‍රයා
3) දෙවියන්වහන්සේගේ මිත්‍රයා
4) ප්‍රිය මිතුරා

04)අපෝස්තුලුවරුන්ගේ ක්‍රියාපොත රචනා වී ඇති ස්ථානය ලෙස සලකනුයේ
1) කොන්ස්තන්තිනෝපල් නගරයේ
2) ජුදයේ ජෙරුසලම නගරය
3) ඇතැන්ස් නුවර
4) ග්‍රීසියේ අක්කායා නම් ස්ථානයේ

05)ඉරු දින දිව්‍ය යාගයේ දී ශු. පාවුලු තුමාගේ සංදේශ භාවිතා කරනු ලබන්නේ
1) දෙවන දේව ප්‍රකාශනය සඳහා
2) සුවිශේෂ ප්‍රකාශනය සඳහා
3) පළමු දේව ප්‍රකාශනය සඳහා
4) පිළිතුරු ගීය සඳහා

06)රුවන් 11 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුවෙකි. ඔහු තම කරේ කුරුසියක් පළඳාගෙන සිටියි. කුරුසිය තුළින් සංකේතවත් වන්නේ කුමක්දැයි විමසූ විට ඔහු දුන් පිළිතුර විය හැක්කේ
1) ගැලවීම හා ආදරය
2) පරිත්‍යාගය හා ජීවන පූජාව
3) දේව ආදරය හා ක්‍රිස්තුන් වහන්සේගේ කීකරුකම
4) අවනතභාවය හා ආදර්ශය

07)එළිදරව්වාදී ග්‍රන්ථයන් සම්පාදනය වීමේ පරමාර්ථය වූයේ
1) දේව ජනතාවට නිසි මග පෙන්වීමට
2) දිවැසිවරුන්ගේ සේවාව ඉටු කිරීමට
3) දේව කැමැත්ත ප්‍රකාශ කිරීමට
4) පීඩන යුගයක සතුරන්ගේ තර්ජනයට ලක්වූ සැදැහැවතුන් දිරිගැන්වීමට

08) නිවැරදි මඟ තෝරා ගනිමින් සාර්ථක ජීවිතයකට දේව දීමනාවක් වන ප්‍රඥාව අත්‍යවශ්‍ය වේ. මෙහි "ප්‍රඥාව" යනුවෙන් අදහස් වන්නේ
1) හොඳින් ඉගෙන උසස් තත්ත්වයකට පැමිණීම.
2) යහපතින් අයහපත වෙන්කර හඳුනා ගැනීම.
3) යහපත් ක්‍රියා නිතර සිදුවීම.
4) කිසිවිට අයහපත නොකිරීමට වගබලා ගැනීම.

09) ඉතා විනෝදජනක දිවියක් ගත කරමින් යහපත අයහපත පිළිබඳ කිසිදු තැකීමක් නොකරන මාටින් මාමා කියා සිටියේ සියල්ල මරණයෙන් අවසාන වන බවය. කිතුනුවාට එය කිසිසේත් පිළිගත නොහැකි වන්නේ
1) මරණය මගින් භෞතික ශරීරය දිරා ගියද අධ්‍යාත්මික ආත්මය නැවත උත්ථාන වන නිසාය.
2) අවසන් විනිශ්චයේ දී අයහපත පරදා යහපත ජයගන්නා නිසාය.
3) යහපත් අය දෙවියන්වහන්සේ තෝරා ගන්නා නිසාය.
4) ඉහත සඳහන් සියලු දේ සිදුවන බව දන්නා නිසාය.

10) ඊශ්‍රායෙල් ඉතිහාසයේ ඥානවන්තම රජු ලෙස සලකන සලමොන් රජතුමාට දෙවිඳුන් හමුවූයේ කොහේදී ද?
1) සීනයි කඳුමුදුනේ දී
2) කාර්මෙල් කන්දේ දී
3) ගිබියොන් හී දී
4) මාරා හී දී

11) තෙවරක්ම ක්‍රිස්තුන්වහන්සේව නාඳුනන බව ප්‍රකාශ කළ අපෝස්තුලුවරයා වන්නේ
1) පේදුරු තුමා
2) ඇන්ඩෲ තුමා
3) ජාකොබ් තුමා
4) ජුවාම් තුමා

12) ජේසුස් වහන්සේගේ කුරුසියෙහි සඳහන් කරන ලද INRI යන්නෙහි අර්ථය වන්නේ
1) "ජේසු තුමා රජ කෙනෙකි"
2) "ජේසු නසරේනු ජුදයින්ගේ රජ"
3) මොහු රජු යැයි තමාම කියා ගත්තේය
4) ජුදයින්ගේ රජුගේ අවසානය

13) ජේසුස් වහන්සේ කුරුසයේ දී පවසන ලද අවසාන වදන වූයේ
1) "සියල්ල අවසානය"
2) "පියාණෙනි ඔබගේ හස්තයට මාගේ ආත්මය බර දෙමි"
3) "මම පිපාසා වෙමි"
4) "පියාණෙනි මොවුන් නොදන කරන වරදට සමාව දුන මැනව"

14) ක්‍රිස්තු උත්ථානයට සාක්ෂි දැරීම සඳහා කිතුනු සිසුවකු ලෙස
1) නිතර යාච්ඤා කළ යුතුය.
2) යහපත් ක්‍රියා කරමින් සතුටින් දිවි ගෙවිය යුතුය.
3) තම පවුලට මනස්ථාප වී දේව අභිමතය අනුව කටයුතු කළ යුතුය.
4) නිතර වන්දනා ගමන් යමින් තම විශ්වාසය සැමට ප්‍රකාශ කළ යුතුය.

15) පංච පුස්තකය රචනා වීම සඳහා ප්‍රධාන දේව ධාර්මික සම්ප්‍රදයන් 4ක් දායක වී ඇති බව ශු. ලියවිලි විශාරදයින්ගේ පිළිගැනීමයි. එම සම්ප්‍රදය වන්නේ
1) උත්පත්ති, එලොහිම්, යාමේ, පූජක
2) උත්පත්ති, නික්මයාම, ද්විතිය නීති, ලෙවී
3) ගණන් කථාව, පූජක, යාමේ, උත්පත්ති
4) යාමේ, එලොහිම්, පූජක, ද්විතිය නීති

16)පංච පුස්තකයේ ඇති වැදගත්කම පිළිබඳ පහත ප්‍රකාශන අතරින් වඩා නිවැරදි ප්‍රකාශය වන්නේ
1) දේව ධාර්මික මඟපෙන්වීමක් ලබා දෙමින් මැවුම්කරුවාණන් මිදුම්කරුවාණන් බව පෙන්වා දෙයි.
2) දෙවියන් වහන්සේට සියල්ල කල හැකි බව පෙන්වා දෙයි.
3) ඊශ්‍රායෙල් ජනයා විමුක්තිය ලබා ගත් ආකාරය පෙන්වා දෙයි.
4) අප නිතර දේව කැමැත්තට හිස නැමිය යුතු බව පෙන්වා දෙයි.

17)කතෝලික බයිබලයට අනුව පුරාණ ගිවිසුමේ සම්මත ග්‍රන්ථ 46ක් අඩංගු වේ. එම පොත් 46 ලැබී ඇත්තේ
1) ග්‍රීක පිටපත හෙවත් සෙප්පුවාජින්තයෙනි
2) හේබ්‍රෙව් පිටපතින්ය
3) මැසරෙටින් පිටපතින්ය
4) ජුදෙව් හා ප්‍රොතෙස්තන්තිනුවන්ගෙන්ය

18)සෙප්ටුවාජින්තය යන ග්‍රීක වචනයේ අර්ථය වන්නේ
1) 76 යන්නය
2) 70 යන්නය
3) 39 යන්නය
4) 46 යන්නය

19)මෙම ප්‍රකාශ අතරින් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ
1) කිතුනුවකු ලෙස හැකි සෑම විටම බයිබලය පිළිබඳ හැදෑරිය යුතුය.
2) ශුද්ධ බයිබලයට තෙල්මල් පූජා කොට උසස් ස්ථානයක තැබිය යුතුය.
3) දිනපතා ශු. බයිබලය කියවා එයින් ලැබෙන පණිවිඩය අනුව දිවි ගෙවිය යුතුය.
4) ගෙයින් ගෙට ගොස් ශු. බයිබලයේ උපුටාගත් දේව වාක්‍ය පැහැදිලි කළ යුතුය.

20)මෙම දිවැසිවරුන් අතරින් සුළු දිවැසිවරුන් ඇතුළත් පිළිතුර වන්නේ
1) ජෝනා, මීනා, හබන්කුක්, මලාකි
2) යෙසායා, එලීෂා, හුල්ද, නාහුම්
3) ජෙරමියා, යෙසායා, මලාකි, මීනා
4) නාතාන් එලීෂා, මීනායා, එලියා

21)"මා නුඹ පිළිසිඳ ගැනීම ඇතිකරන්නටත් පෙර මම නුඹ හඳුනාගතිමි."
දෙවියන් වහන්සේ මෙසේ ප්‍රකාශ කරමින් කැඳවන ලද දිවැසිවරයා වූයේ
1) යෙසායා දිවැසිවරයාව
2) එසකියෙල් දිවැසිවරයාව
3) හොසියා දිවැසිවරයාව
4) ජෙරමියා දිවැසිවරයාව

22)දෙවියන් වහන්සේ යෙසායා දිවැසිවරයාට "………………… අප වෙනුවෙන් යන්නේ කවරෙක් ද?"
පැවසූ අවස්ථාවේ යෙසායා දිවැසිවරයා "…………………… මා යැව්ව මැනවැ'යි කීය".
හිස්තැන්වලට අදළ පිළිතුරු වනුයේ
1) මම ඔබ කැඳවමි/ මම කැමතියි
2) මට ඇහුම්කන්දෙන්න/ මෙන්න මම ගියා
3) මම කවරෙකු යවම්ද? මෙන්න මම මෙහිය
4) මම කවරෙකු යවම්ද? මට හැකිය

23)ශුභාරංචි කතුවරුන් අතරින් ක්‍රිස්තුන්වහන්සේගේ ශ්‍රාවකයන් වන්නේ
1) ශු. ලූක් තුමා, ශු. මාක් තුමා
2) ශු. ජුවාම් තුමා, ශු. මතෙව් තුමා
3) ශු. ජුවාම් තුමා, ශු. ලූක් තුමා
4) ශු. මතෙව් තුමා, ශු. ලූක් තුමා

24)ශු. සභාවේ ශුභාරංචිය දේව රාජ්‍යයේ ශුභාරංචිය ලෙස හඳුන්වනු ලබන ශුභාරංචිය
1) ශු. ලූක් ශුභාරංචිය
2) ශු. ජුවාම් ශුභාරංචිය
3) ශු. මාක් ශුභාරංචිය
4) ශු. මතෙව් ශුභාරංචිය

25)ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය පිළිබඳ සුවිශේෂ හතරෙහිම සඳහන් සිදුවීමක් වන්නේ
1) ජේසුස් වහන්සේගේ දුක්විඳීමේ මරණය
2) ජේසුස් වහන්සේගේ උපත
3) ජේසුස් වහන්සේගේ මහිමාන්විත උත්ථානය
4) ජේසුස් වහන්සේගේ දූත සේවය

26)උත්පත්ති පොතෙහි ප්‍රාග් ඉතිහාසයට අයත් වන පරිච්ඡේදයක් වනුයේ
1) උත්පත්ති 1 සිට අවසාන පරිච්ඡේදය
2) උත්පත්ති 1 සිට 11 වන පරිච්ඡේදය
3) උත්පත්ති 1 - 2:4 සිට අවසාන 25 පරිච්ඡේදය
4) උත්පත්ති 1 සිට 25 පරිච්ඡේදය

27)ආදි මව්පියන් වන ආදම් සහ ඒව කල පාපය වන්නේ
1) උඩඟුව නිසා දේව අණ කඩකිරීම
2) යක්ෂ පරීක්ෂාවට හසුවීම
3) තහනම් ගසේ ගෙඩි කෑම
4) ජන්ම පාපය

28)වර්තමාන සමාජය තුළ රුචියට වහල් වීම නිසා බොහෝ දෙනා වැරදි ක්‍රියාවන්වල නිරත වෙති. මෙයින් මිදීමට නම්
1) එම අවස්ථාවලදී එයට හසුවුවහොත් සමාව ලබාගත යුතුය.
2) නිතරම ආශාවන්ගෙන් තොරව කටයුතු කළ යුතුය.
3) යාච්ඤා කරමින් කල්ගත කල යුතුය.
4) යහපත අයහපත කිසි ලෙස වටහා ගනිමින් දේව කැමැත්තට අවනතව කටයුතු කළ යුතුය.

29)මෙලොව පාපය වර්ධනය වීම හේතුවෙන් දෙවියන් වහන්සේ ලෝකය ජල ගැල්මකින් විනාශ කිරීමට තීරණය කළ සේක. එහිදී නව මැවිල්ලේ ආරම්භකයා වීමට කැඳවන ලද්දේ
1) ක්‍රිස්තුන්වහන්සේ ය.
2) ආබ්‍රහම් තුමාව ය.
3) නෝවා ය.
4) මෝසෙස් තුමාව ය.

30)ඉරුදින දිව්‍ය යාගයට හා දහම් පාසලට සහභාගී වෙනවා යැයි පවසමින් නිවසින් පිටවන දමිත් එයට සහභාගී නොවී ක්‍රිකට් තරගයක් නැරඹීමට යයි. මෙහිදී ඔහු කරන ලද වරද වන්නේ
1) තම සතුට ගැන පමණක් සිතීම
2) රුචියට වහල් වෙමින් දෙවිඳුන් රැවටීම
3) දිව්‍ය යාගයට හා දහම් පාසලට නොයෑම
4) දෙමාපියන් රැවටීම

31)"පොළවෙන් නුඹ නෙරපා දමනු ඇත. මෙතැන් සිට නුඹ වගා කරන විට එය නුඹට එලදාව නොදෙන්නේය." දෙවියන් වහන්සේ මෙසේ පවසන ලද්දේ
1) ආදම්ටය
2) ඒවටය
3) ජුදස්ටය
4) කායින්ටය

32)දෙවියන් වහන්සේ විසින් මිසර වැසියන් වෙත එවන ලද තුන්වන හා දහවන වසංගතය වන්නේ
1) කිනිතුලු උවදුර හා කුලුදුලන්ගේ මරණය
2) මැසි උවදුර හා ගනඳුරු උවදුර
3) පළගැටි උවදුර හා වතුර ලේ වීම
4) ගඩු උවදුර ගහා කුළුදුලන්ගේ මරණය

33)දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමඟ ඇතිකරගත් ගිවිසුමේ බාහිර සළකුණ වන්නේ
1) නොදැවෙන ගිනි පඳුරයි
2) දේදුන්නයි
3) කුරුසියයි
4) චර්ම ඡේදනයයි

34) ඊශ්‍රායෙල් ජනතාව සීනයි ගිවිසුම මගින් දේව ජනතාවක් වූවා සේම අපද ප්‍රසාද ස්නාපනය තුළින් දේව දරුවන් වීමට ඇති කරගත් ගිවිසුම වන්නේ

1) සියලු නපුරෙන් වැළකීම පාපය පිටු දැකීම
2) දිනපතා දෙව්දු යැදීම පව් නොකිරීම
3) දෙවියන්වහන්සේව විශ්වාස කිරීම නපුරා හා ක්‍රියා ප්‍රතික්ෂේප කිරීම
4) බහුදේව වන්දනාවේ නොයෙදීම හා එකම දෙවිදුන් නැමදීම

35) "ඔහු ඊශ්‍රායෙල්වරු බොහෝ දෙනෙකු ඔවුන්ගේ දෙවි ස්වාමින් වහන්සේ වෙත හරවන්නේ ය." මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින්ද?

1) ජේසුස් වහන්සේ ගැනය
2) ස්නාවක ජොහාන්තුමා ගැනය
3) මෝසෙස් තුමා ගැනය
4) ආබ්‍රහම් තුමා ගැනය

36) ස්නාවක ජොහාන්තුමාගේ මරණයට ප්‍රධානම හේතුව වූයේ

1) හෙරෝද් රජුගේ වැරදි ක්‍රියා ප්‍රසිද්ධියේ හෙළා දැකීම
2) ජුද ප්‍රභුවරුන්ට එම්බා පොළොං වංශය ලෙස ඇමතීම
3) පව්කරුවන් මනස්ථාපයට කැඳවමින් වනයේ සැරිසැරීම
4) එකිනෙකාගේ වැරදි නොබියව ප්‍රකාශ කිරීම

37) ජේසුස් වහන්සේ ප්‍රසාද ස්නාපනයෙන් පසු සිදුකරන ලද පළමු ක්‍රියාව වන්නේ

1) යක්ෂ පරීක්ෂා ජයගැනීම
2) ගලීලයේ ගොස් දිවැසිවර යෙසායාගේ ග්‍රන්ථය කියවීම
3) දින 40 පාළුකරයේ යාච්ඤාවේ නිරත වීම
4) ප්‍රාතිහාර්යය සිදුකිරීම

38) ජේසුස් වහන්සේගේ වචන හා ක්‍රියාවන්ගේ හරය වූයේ කුමක්ද?

1) දේව රාජ්‍යයේ උදවය
2) අවසාන විනිශ්චය පිළිබඳවය
3) ප්‍රේමයේ රාජ්‍ය පිළිබඳවය
4) අනන්ත ජීවිතය පිළිබඳවය

39) "නිහතමානී ගුණ ඇත්තෝ භාග්‍යවන්තයෝ ය. ............ ය."
හිස්තැනට අදළ පිළිතුර වන්නේ

1) ඔවුහු තෘප්තිමත් වන්නෝය
2) ඔවුහු දේශය උරුමකරගන්නෝය
3) ඔවුහු දෙවියන් වහන්සේ දකින්නෝය
4) ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේය

40) පැවිදි දිවියේ ලක්ෂණ තුන වන්නේ

1) යාච්ඤාවේ ජීවිතය/ දිළිඳුකම/ වෘත ශුද්ධිය
2) සාංඝික ජීවිතය/ වෘත ශුද්ධිය/ කීකරුකම
3) වෘත ශුද්ධිය/ කීකරුකම/ දිළිඳුකම
4) සාංඝික ජීවිතය/ යාච්ඤාවේ ජීවිතය/ සේවයේ ජීවිතය